සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

87 S I

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020
## Frist Term Test - Grade 10 - 2020

### සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I

නම/විභාග අංකය : ....................................... කාලය : පැය 03 යි.

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට, දී ඇති 1, 2, 3, 4 උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුරට අදාළ වරණය තෝරා ගන්න.
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා ඔබ තෝරාගත් වරණයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

---

(1) සන්නිවේදකයා යනු,
1. සන්නිවේදන ක්‍රියාවලියේ අවසාන පුද්ගලයා ය.
2. සංදේශය ලබා ගන්නා පුද්ගලයා ය.
3. සන්නිවේදන ක්‍රියාවලියේ ආරම්භකයා ය.
4. සන්නිවේදනයට බාධා ඇති කරන්නා ය.

(2) 1949 වර්ෂයේ දී සන්නිවේදනය පිලිබඳ ගණිතමය සූත්‍රය ඉදිරිපත් කරන ලද්දේ,
1. හැරල්ඩ් ඩී. ලැස්වෙස්
2. ශ්‍රාම් ඔස්ගුඩ්
3. විල්බර් ශ්‍රාම්
4. ක්ලෝඩ් ෂැනොන් හා වොරන් වීවර් විසිනි.

(3) අවුරුදු 18 500 පමණ පෙර නිර්මාණය කරන ලද ප්‍රසිද්ධ ගුහා චිත්‍ර ඇඳි ස්ථාන වන්නේ,
1. ස්පාඤ්ඤයේ ලැස්කෝ සහ ප්‍රංශයේ අල්ටාමීරා
2. ප්‍රංශයේ ලැස්කෝ සහ ස්පාඤ්ඤයේ අල්ටාමීරා
3. ප්‍රංශයේ ලැස්කෝ සහ ස්පාඤ්ඤයේ දොරවක
4. ස්පාඤ්ඤයේ අල්ටාමීරා සහ ප්‍රංශයේ බිල්ලෑව

(4) ලොව මුල්ම කඩදාසිය නිර්මාණය කරන ලද්දේ,
1. ක්‍රි.පූ. 1 වන සියවසේ දීය.
2. ක්‍රි.පූ. 10 වන සියවසේ දීය.
3. ක්‍රි.පූ. 20 වන සියවසේ දීය.
4. ක්‍රි.පූ. 30 වන සියවසේ දීය.

(5) මානවයා විසින් තම කටහඬ මගින් යම් අදහසක් ප්‍රකාශ කරන්නට උත්සහ ගැනීම නිසා බිහි වූයේ,
1. ලිඛිත භාෂාවයි.
2. කථන භාෂාවයි.
3. ශ්‍රව්‍ය භාෂාවයි.
4. දෘශ්‍ය භාෂාවයි.

(6) පාසලේ පැවති බෞද්ධ සමිතියේ දී එළඹෙන වෙසක් පොහොය දින දන්සැලක් පැවැත්වීම පිළිබඳ සාකච්ඡා විය. මෙය,
1. සමූහ සන්නිවේදන අවස්ථාවකි.
2. පුද්ගලාන්තර සන්නිවේදන අවස්ථාවකි.
3. අන්තර්වර්ති සන්නිවේදන අවස්ථාවකි.
3. ජන සන්නිවේදන අවස්ථාවකි.

(7) මානව ඉතිහාසය තුළ පළමුවෙන්ම බිහිවූ සන්නිවේදන ස්වරූපය වන්නේ,
1. වාචික සන්නිවේදනය
2. ශ්‍රව්‍ය සන්නිවේදනය
3. අවාචික සන්නිවේදනය
4. දෘශ්‍ය සන්නිවේදනය

(8) පුද්ගලයා සමාජයට අනුගත වීමේ ක්‍රියාවලිය,
1. පෙළඹවීම යි.
2. ඒකාබද්ධතාවය යි.
3. සමාජානුයෝජනය යි.
4. බලපෑම යි.

(9) අරාබි භාෂාව ලේඛනය කරනු ලබන්නේ,
1. වමේ සිට දකුණට ය. 2. ඉහළ සිට පහළට ය.
3. පහළ සිට ඉහළට ය. 4. දකුණේ සිට වමට ය.

(10) සන්නිවේදකයා යම් මාධ්‍යයක් ඔස්සේ ඉදිරිපත් කරනු ලබන සංදේශය ග්‍රහණය කර ගනු ලබන පාර්ශවය හඳුන්වන්නේ,
1. නිරීක්ෂකයා 2. ග්‍රාහකයා 3. විචාරකයා 4. සහෘදයා

(11) රූපාක්ෂර හෙවත් චිත්‍රාක්ෂරවල විශේෂත්වය,
1. හඬක් වෙනුවට අදහසක් ඉදිරිපත් කිරීමයි. 2. හඬක් වෙනුවට අදහසක් ඉදිරිපත් නොකිරීමයි.
3. උච්චාරණය කළ හැකි හඬක් සහිත විට ය. 4. උච්චාරණය කළ හැකි හඬක් රහිත විට ය.

(12) ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය වඩාත් හොඳින් සිදුවන්නේ,
1. ජන සන්නිවේදනයේ දීය. 2. අන්තර් පුද්ගල සන්නිවේදනයේ දීය.
3. සමූහ සන්නිවේදනයේ දී ය. 4. අන්තර් වර්ති පුද්ගල සන්නිවේදනයේ දීය.

(13) භාෂාවේ දෘෂ්‍ය ස්වරූපය වන්නේ,
1. ශ්‍රව්‍ය සන්නිවේදනයයි. 2. අවාචික සන්නිවේදනයයි.
3. වාචික සන්නිවේදනයයි. 4. ලිඛිත සන්නිවේදනයයි.

(14) ශිෂ්‍ය නායක මණ්ඩලය කැඳවූ විදුහල්පතිතුමා, සිසුන්ගේ නිල ඇඳුම ක්‍රමවත්ව සකස් විය යුතු ආකාරය පිළිබඳව දැනුවත් කළේ ය. මෙය,
1. පහළ සිට ඉහළට සන්නිවේදනයයි. 2. ඉහළ සිට පහළට සන්නිවේදනයයි.
3. හරස් සන්නිවේදනයයි. 4. අවිධිමත් සන්නිවේදනයයි.

(15) අවාචික සන්නිවේදනයේ ශාරීරික සාධකයක් නොවන්නේ,
1. ඇස්වල හැසිරීම. 2. ස්වාභාවික ශබ්ද
3. ඇඳුම් පැළඳුම් 4. මුහුනේ ඉඟි හා ඉරියව්.

(16) පහත සඳහන් මාධ්‍ය කාණ්ඩ අතරින් නූතන දෘශ්‍ය මාධ්‍යයට අයත් විය හැකි කාණ්ඩය වන්නේ,
1. බෙර හඬ හා පෝස්ටර් 2. ගින්දර හා පොත් පිංච
3. දුම හා බිත්ති සටහන් 4. අත් පත්‍රිකා හා ධාරා සටහන්

(17) රූපාක්ෂර වලට නිදසුනකි,
1. කොරියානු අක්ෂර 2. ඉංග්‍රීසි අක්ෂර
3. දෙමළ අක්ෂර 4. රුසියානු අක්ෂර

(18) සන්නිවේදනය යන්නෙන් අදහස් වන්නේ,
1. පුද්ගලයෙකු සිය හැඟීම්, සිතිවිලි හා අදහස් අන්‍යයන් සමඟ හුවමාරු කර ගැනීමයි.
2. සන්නිවේදකයා තමා ඉදිරියේ සිටින පුද්ගලයෙකු සමඟ පමණක් සන්නිවේදනයේ යෙදීමයි.
3. විනෝදාස්වාදය පමණක් ලබා දීමය.
4. සම්මත ව්‍යාකරණ විධි භාවිතා කිරීමයි.

(19) සාම්ප්‍රදායික ශබ්ද මාධ්‍යයකි,
1. ගින්දර 2. චිත්‍ර 3. දුම 4. සණ්ටාර හඬ

(20) සංජානනය යනු,
1. සන්නිවේදන බාධකයක් සිදුවී ඇති බව හඳුනා ගැනීමයි.
2. සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර සමීප සම්බන්ධතාවයක් පැවතීමයි.
3. කෙනෙකුගේ පංචේන්ද්‍රිය මඟින් ලැබෙන විවිධ සංදේශ ග්‍රහණය කර ගෙන එය තේරුම් ගැනීමයි.
4. සන්නිවේදකයාගේ සිට ග්‍රාහකයා වෙත යන සංදේශ පාලනය කිරීමයි.


(21) කම්බියක් ඔස්සේ හඬ යැවීමේ දුරකතන ක්‍රමය සොයා ගනු ලැබුවේ,
1. සැමුවෙල් මෝස් විසිනි. 2. ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල් විසිනි.
3. ගුග්ලිමෝ මාකෝනි විසිනි. 4. සායි ලූන් විසිනි.

(22) පුද්ගලයෙකුගේ සන්නිවේදන කාර්යය ආරම්භ වන්නේ,

1. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයෙනි.
3. ජන සන්නිවේදනයෙනි.
3. සමූහ සන්නිවේදනයෙනි.
4. අන්තර් පුද්ගල සන්නිවේදනයෙනි.

(23) පහත සඳහන් රූපසටහන් දක්වෙන්නේ,

1. තනි දාමය
2. පර්ෂද දාමය
3. ඕපාදූප දාමය
4. සම්භාවිතා දාමය




(24) සන්නිවේදන ක්‍රියාවලියේ දී දොරටු පාලගේ කාර්යය,

1. සන්නිවේදකයාගේ සිට ග්‍රාහකයා වෙත යන සංදේශය බාධාවකින් තොරව ගලා යාමට සැලැස්වීමයි.
2. ග්‍රාහකයාගේ සිට සන්නිවේදකයා වෙත යන සංදේශය බාධාවකින් තොරව ගලා යාමට සැලැස්වීමයි.
3. ග්‍රාහකයාගේ සිට සන්නිවේදකයා වෙත යන සංදේශය පාලනය කිරීමයි.
4. සන්නිවේදකයාගේ සිට ග්‍රාහකයා වෙත යන සංදේශය පාලනය කිරීමයි.

(25) අභිසාරී මාධ්‍යයකි,

1. ගුවන් විදුලිය 2. අන්තර්ජාලය 3. ෆැක්ස් යන්ත්‍රය 4. රූපවාහිනිය.

(26) ගුවන්විදුලි හා පුවත්පත යන මාධ්‍ය පදනම් වී ඇත්තේ,

1. අවාචික හා දෘශ්‍ය සන්නිවේදනයට යි.
2. දෘශ්‍ය හා ලිඛිත සන්නිවේදනයට යි.
3. ශ්‍රව්‍ය හා දෘෂ්‍ය සන්නිවේදනයට යි.
4. ශ්‍රව්‍ය හා අවාචික සන්නිවේදනයට යි.

(27) සන්නිවේදන ක්‍රියාවලියක ප්‍රධාන පියවර තුන පිළිවෙළින් දක්වෙන වරණය තෝරන්න.

1. ග්‍රාහකයා → සංදේශය → සන්නිවේදනය
2. ග්‍රාහකයා → සංදේශය → දොරටුපාලකයා
3. සන්නිවේදකයා → සංදේශය → දොරටුපාලකයා
4. සන්නිවේදකයා → සංදේශය → ග්‍රාහකයා

(28) ග්‍රාහක පද්ධතිය ඉතා විශාල හා පැතිරුණු ස්වභාවයක් ගැනීම,

1. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ දී සිදුවේ.
2. පුද්ගලාන්තර සන්නිවේදනයේ දී සිදුවේ.
3. ජන සන්නිවේදනයේ දී සිදුවේ.
4. සමූහ සන්නිවේදනයේ දී සිදුවේ.

(29) අවාචික සන්නිවේදනයේ සමාජීය සාධකයන්ට අනුව දෙමාපියන් හා දරුවන් අයත් වන්නේ,

1. සහෘද අවකාශයට ය.
2. පෞද්ගලික අවකාශයට ය.
3. සමාජීය අවකාශයට ය.
4. පොදු අවකාශයට ය.

(30) දුරකතනයේ සංඥා අපැහැදිලි වීම,

1. පාරිසරික බාධකයකි.
2. තාක්ෂණික බාධකයකි.
3. අර්ථ බාධකයකි.
4. මාධ්‍ය බාධකයකි.

(31) නිර්වාචික සන්නිවේදනය ඉතා ප්‍රබල හා කලාත්මක ලෙස භාවිතා කල හැකි ජනමාධ්‍යයකි,

1. ගුවන් විදුලිය
2. සිනමාව
3. රූපවාහිනිය
4. පුවත්පත

(32) පහතින් දැක්වෙන රූප සටහන සලකන්න.
එමගින් නිරූපණය වන්නේ,



1. වාචික සන්නිවේදනය
2. ශ්‍රව්‍ය සන්නිවේදනය
3. ලිඛිත සන්නිවේදනය
4. දෘශ්‍ය සන්නිවේදනය

(33) සංදේශයක් ලැබීමෙන් පසු එම සංදේශය හේතු කොට ගෙන ග්‍රාහකයා තුළ ඇති වන වෙනස,
1. බලපෑමයි. 2. ප්‍රතිපෝෂණයයි.
3. ප්‍රති ග්‍රහණයයි. 4. ප්‍රතිචාරයි.

(34) යම් කෙනෙක්, යම් කිසිවක්, යම් නාලියකින්, යම් කෙනෙකුට බලපෑමක් සඳහා ඉදිරිපත් කරනු ලබන දෙය සන්නිවේදනයයි.
මෙම නිර්වචනය ඉදිරිපත් කළේ,
1. ක්ලෝඩ් ෂැනොන් ය. 2. විල්බර් ශ්‍රාම් ය.
3. හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය. 4. වොරන් වීවර් ය.

(35) සන්නිවේදන වර්ගීකරණය සිදුකරනු ලබන්නේ,
1. සංදේශය අනුවයි. 2. අවකාශය අනුවයි.
3. ප්‍රතිචාර අනුවයි. 4. ග්‍රාහක සංඛ්‍යාව අනුවයි.

(36) ග්‍රාහකයා සමග වඩාත් ඵලදායි සබඳතාවක් ගොඩ නගා ගැනීම සඳහා සන්නිවේදකයා සිය කතා බහේ දී,
1. විදග්ධ භාෂා රටාවක් අනුගමනය කළ යුතු ය.
2. ග්‍රාහකයා බලාපොරොත්තු වන දෑ ඉස්මතු කළ යුතු ය.
3. ග්‍රාහකයා නොසලකා හැරිය යුතු ය.
4. පාරිභාෂික වචන භාවිත කළ යුතු ය.

(37) රූපවාහිනී නිවේදකයෙක් වූ චතුරට, ඔහුගේ වෘත්තියට වඩාත් ම අදාළ වූ සන්නිවේදන ස්වරූප වන්නේ,
1. වාචික, අවාචික 2. විධිමත්, අවිධිමත්
3. ශ්‍රව්‍ය, දෘශ්‍ය 4. ලිඛිත, ශ්‍රව්‍ය

(38) ජන සන්නිවේදනය නූතන සමාජයේ පැවැත්ම කෙරෙහි ඇති කරන බලපෑමක් වන්නේ,
1. රස වින්දනය වෙනස් නොකිරීම
2. විවිධ යෝග්‍ය මෙන් ම අයෝග්‍ය පුරුදු ඇති කිරීම.
3. විවිධ සමාජාර්ථ පුද්ගලයන් තුළ ගොඩනැගීමට උත්සාහ නොගැනීම.
4. සාමාජීය ගැටලු නිවැරැදි ආකාරයට තේරුම් ගැනීමට පුරුදු වීම.

(39) වාචික සන්නිවේදනයේ දී කතිකයෙකු භාෂාව සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු වන්නේ,
1. විනෝදාස්වාදයට ය. 2. යෝග්‍යතාවට ය.
3. කාලයට ය. 4. බාධාවන්ට ය.

(40) අක්ෂි සම්බන්ධතාව යනුවෙන් හඳුන්වන්නේ,
1. අක්ෂි දෝෂයකි.
2. පුද්ගලයෙකු සමඟ කතා කිරීමේ දී ඉවත බැලීමයි.
3. උපැස් යුවලක් පැලඳීමයි.
4. කෙනෙක් සමඟ කතා කිරීමේ දී ඒ පුද්ගලයාගේ ඇස් දෙසට යොමු වීමයි.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

87 | S | II

# පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

# Frist Term Test - Grade 10 - 2019

**නම : ....................................  සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II**

වැදගත් :

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

---

(01) වර්තමාන සමාජයේ ජීවත් වන මානවයාට විවිධ ක්‍රමවේද හරහා නොයෙකුත් තොරතුරු ග්‍රහණය කර ගැනීමට අවස්ථාව උදා වී ඇත.

i) සන්නිවේදනයේ මූලික කාර්යයන් දෙකක් නම් කරන්න.

ii) සන්නිවේදන ක්‍රියාවලියට සම්බන්ධ වන පාර්ශව දෙක නම් කරන්න.

iii) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයේ විශේෂතා දෙකක් නම් කරන්න.

iv) ද්වි පුද්ගල සන්නිවේදනය සිදු කෙරෙන අවස්ථා දෙකක් නම් කරන්න.

v) විශාල පිරිසක් සමග සිදු කෙරෙන සන්නිවේදනය හඳුන්වන නම ලියන්න.

vi) නූතන ශබ්ද මාධ්‍ය දෙකක් නම් කරන්න.

vii) ග්‍රාහකයාගේ සංජානනයට බාධා පැමිණෙන හේතු දෙකක් දක්වන්න.

viii) සබකෝලය යන්න කෙටියෙන් හඳුන්වන්න.

ix) ජන සන්නිවේදනය සිදු කෙරෙන මාධ්‍ය දෙකක් නම් කරන්න.

x) අභිසාරී මාධ්‍ය යන්න හඳුන්වන්න.

(02) සන්නිවේදකයාගේ අරමුණ වන්නේ තමන්ගේ සන්දේශය නිසි ලෙස ග්‍රාහකගත කිරීමයි.

i) සන්නිවේදන ක්‍රියාවලිය තුළ බාධක යන්න ආකෘති මඟින් මුලින්ම ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින් ද?

ii) අන්තර් පුද්ගල සන්නිවේදනය සඳහා යොදා ගන්නා තාක්ෂණික මෙවලම් හතරක් නම් කරන්න.

iii) සන්නිවේදන බාධක වර්ග දෙක විස්තර කරන්න.

iv) සන්නිවේදන බාධක ඇතුලත් ආකෘතිය ඇඳ නම් කරන්න.

(03) i) ජීව දත්ත පත්‍රිකාවක් සකස් කිරීමේ දී සැලකිය යුතු කරුණු දෙකක් නම් කරන්න.

ii) නිර්වාචික සන්නිවේදන විධික්‍රම දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

iii) සමූහ සන්නිවේදනයේ විශේෂතා තුනක් විස්තර කරන්න.

iv) හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ සන්නිවේදන ආකෘතිය ඇඳ නම් කරන්න.

(04) i) සාම්ප්‍රදායික දෘශ්‍ය මාධ්‍ය දෙකක් නම් කරන්න.

ii) සන්නිවේදන මූලිකාංග දෙකක් විස්තර කරන්න.

iii) වාචික භාෂාවට වඩා ලිඛිත භාෂාව විධිමත් වීමට හේතු තුනක් කෙටියෙන් විස්තර කරන්න.

iv) ද්වි මාර්ගික සන්නිවේදන සූත්‍රය ඇඳ නම් කරන්න.

(05) i) කථිකයෙකු හාත්පස පිරිස දෙස නිරතුරුව බලමින් කතාව ඉදිරියටම කර ගෙන යයි. ග්‍රාහක අවධානය දිනා ගැනීමට ඔහු යොදාගන්නා ක්‍රමවේදය කුමන නමකින් හැඳින්වේද?

ii) ඵලදායි ලේඛණයක ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

iii) වාචික සන්නිවේදන නිපුණතා සංවර්ධනයට ගත යුතු ක්‍රියා මාර්ග තුනක් විස්තර කරන්න.

iv) ගුවන්විදුලිය හා රූපවාහිනිය යන ජන මාධ්‍ය අද සමාජයට වැදගත් වන්නේ කෙසේදැයි කරුණු හතරක් ඇසුරින් විස්තර කරන්න.

(06) i) තමන් තමන් සමගම කරනු ලබන සන්නිවේදනය හඳුන්වන නම කුමක්ද?

ii) විධිමත් සන්නිවේදන ආකෘති හතර ඇඳ නම් කරන්න.

iii) සංවිධානයක් තුළ විධිමත් සන්නිවේදනය ක්‍රියාත්මක වන ආකාර තුන නම් කර විස්තර කරන්න.

iv) උත්තේජන - ප්‍රතිචාර සිද්ධාන්තය රූපවාහිනි, වෙළඳ දැන්වීම් වලදී උපයෝගී කර ගන්නා ආකාරය උදාහරණ දෙකක් ඇසුරින් විස්තර කරන්න.

(07) i) දෘශ්‍ය සන්නිවේදනය සඳහා උදාහරණ දෙකක් නම් කරන්න.

ii) අවිධිමත් සන්නිවේදන ආකෘති දෙකක් නම් කර කෙටියෙන් විස්තර කරන්න.

iii) භාෂාවේ මූලික කාර්යයන් තුනක් පැහැදිලි කරන්න.

iv) ජන සන්නිවේදනයේ මූලික ලක්ෂණ හතරක් විස්තර කරන්න.

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

87 S I, II

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 10 - 2020

### සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 3 | (11) | 1 | (21) | 2 | (31) | 2 |
| (2) | 4 | (12) | 2 | (22) | 1 | (32) | 4 |
| (3) | 2 | (13) | 4 | (23) | 3 | (33) | 1 |
| (4) | 1 | (14) | 2 | (24) | 4 | (34) | 3 |
| (5) | 2 | (15) | 2 | (25) | 2 | (35) | 4 |
| (6) | 1 | (16) | 4 | (26) | 3 | (36) | 2 |
| (7) | 3 | (17) | 1 | (27) | 4 | (37) | 3 |
| (8) | 3 | (18) | 1 | (28) | 3 | (38) | 2 |
| (9) | 4 | (19) | 4 | (29) | 1 | (39) | 2 |
| (10) | 2 | (20) | 3 | (30) | 4 | (40) | 4 |

(ලකුණු 40 x 1 = 40)

## II පත්‍රය

(01) i) * තොරතුරු සැපයීම. * අධ්‍යාපනය ලබා දීම. * විනෝදාස්වාදය * පෙළඹ වීම.
* සමාජානු යෝජනය * සංවාද හා සාකච්ඡා

ii) * සන්නිවේදනය * ග්‍රාහකයා

iii) * සිතිවිලි හා හැඟීම් මත සන්නිවේදනය සිදු වීම.
* තම දැක්මට අනුව සංකල්ප ක්‍රියාත්මක වීම. * ආත්ම භාෂණයට ප්‍රමුඛත්වය ලැබීම.
* පුද්ගල තීරණ ගැනීමේ කාර්යය සිදු වීම. * තමා තුල පවතින මතකය අනුව සන්නිවේදනය සිදු වීම.
* තමාගේ අර්ථකථනයට අනුව සන්නිවේදනයෙහි යෙදීම.

iv) * වෛද්‍යවරයෙකු හමු වීම. * බසයේ කොන්දොස්තර සමඟ කතා කිරීම.
* පොලීසියට ගොස් පැමිණිල්ලක් කිරීම.

v) ජන සන්නිවේදනය

vi) * ගුවන් විදුලිය * සංගීතය * කෘත්‍රිම නාද * විවිධ නාද සංඥා

vii) * සංදේශයේ තොරතුරු විකෘති වී තිබීම. * ග්‍රාහකයාගේ අත්දැකීම් පසුතලයට නොගැලපීම.
* වැරදි ලෙස තොරතුරු ගොනුකර සංදේශය සැකසීම. * සංදේශයේ තොරතුරු විකෘති වී තිබීම.

viii) සභාවට ඇති ලැජ්ජාව

ix) * රූපවාහිනිය * ගුවන් විදුලිය * පුවත්පත්


x) විවිධ මාධ්‍ය එකට හමු වීම යන්නයි. (ලකුණු 2 x 10 = 20)

(02) i) ක්ලේඩ් ෂැනොන් හා වොරන් වීවර් (ලකුණු 1)

ii) * දුරකථන (ජංගම හා ස්ථාවර)* තැපැල් ලිපි * ෆැක්ස් පණිවුඩ * විද්‍යුත් තැපැල
* අන්තර් ජාල දුරකථනය * සමාජ ජාල වැනි නව මාධ්‍ය (ලකුණු 2)

iii) අර්ථ බාධක මාධ්‍ය බාධක (විස්තර කළ යුතු ය.) (ලකුණු 3)

iv)




(ලකුණු 4)

(03) i) * $A_4$ කඩදාසි භාවිතය * මාතෘකා තද කළු අකුරින් * වර්ණ අකුරු හෝ කඩදාසි යොදා නොගැනීම.
* පරිගනක අකුරු භාවිතය * සැලැස්ම (ලකුණු 1)

ii) * මුහුණේ ඉරියව් * ඇස්වල හැසිරීම් * අංග චලනය * ඇඳුම් පැළඳුම්
* ස්පර්ශය * සංඥා සංකේත (ලකුණු 2)

iii) * සමූහය කුඩා හෝ විශාල විය හැකියි. * බොහෝ දුරට ඒක පාර්ශ්විය සන්නිවේදනයක් සිදු වේ.
* සන්නිවේදකයා ඉදිරියේ සිටින සමූහය සන්නිවේදකයා දන්නා අය මෙන්ම නොදන්නා අයගෙන් සමන්විත වේ. .........
(ලකුණු 3)


iv) සන්නිවේදකයා ⟶ සන්දේශය ⟶ මාධ්‍යය ⟶ ග්‍රාහකයා ⟶ බලපෑම
Communicator Massage Medium Receiver Effect (ලකුණු 4)

(04) i) * ගින්දර * දුම * චිත්‍ර * ගස්වල එල්ලූ කොළ අතු * ගස්වල කැපූ කට්ටා (ලකුණු 1)

ii) * සන්නිවේදකයා * ග්‍රාහකයා * සංදේශය * බලපෑම * මාධ්‍යය (ලකුණු 2)

iii) * අක්ෂර වින්‍යාස තිබීම. * ව්‍යාකරණ තිබීම. * අකුරුවලට හැඩයක් තිබීම.
* විරාම ලකුණු යෙදිය යුතු වීම. * වචන ඇත් කර ලිවීම. (ලකුණු 3)

iv)




(ලකුණු 4)

(05) i) ප්‍රදීපාගාර උපක්‍රමය (ලකුණු 1)


ii) * නිරවුල් බව හා පැහැදිලි බව * ලේඛනයට උචිත ආකෘතිය හා නිර්මාණශීලී බව
* සම්මත ව්‍යාකරණ විධි භාවිතය (ලකුණු 2)

iii) * කථන රටා පුහුණු වීම. * කථනය සඳහා පෙර සූදානම * සවන්දීමට පුහුණු වීම.
* තමා සතු තොරතුරු - අදහස් ප්‍රමාණය පුළුල් කර ගැනීම. (ලකුණු 3)

iv) * අධ්‍යාපන කාර්යය - උදා ඃ- ජාතික පාසල, නැණ මිහිර
* තොරතුරු සම්පාදනය * විනෝදාස්වාදය * සමාජානුයෝජනය (ලකුණු 4)

(06) i) අන්තර් වර්තී පුද්ගල සන්නිවේදනය (ලකුණු 1)

ii)




(ලකුණු 4)

iii) * ඉහළ සිට පහළට සන්නිවේදනය * පහළ සිට ඉහළට සන්නිවේදනය
* හරස් සන්නිවේදනය (ලකුණු 3)

iv) කෑම, බීම, ගෘහ භාණ්ඩ, විදුලි උපකරණ, සුවඳ විලවුන්.... ආදිය (ලකුණු 2)

(07) i) මාර්ග සංඥා, පෝස්ටර්, අත් පත්‍රිකා, බිත්ති සටහන්, ධාරා සටහන් (ලකුණු 1)

ii) * තනි දාමය * ඔපා දූප දාමය * සම්භාවිතා දාමය* පර්ෂද දාමය (ලකුණු 2)

iii) * සිතීම විධිමත් කිරීම. * සැබෑව හඳුනා ගැනීම. * දැනුම සංරක්ෂණය
* පැවැත්ම පිළිබඳ සාධක ඉදිරියට ගෙන යාම (ලකුණු 3)

iv) සංදේශය පොදු වූවකි.
සන්නිවේදකයා හා ග්‍රාහකයා අභිමුඛ නොවේ.
සංවිධිත ආයතනයක් මඟින් ක්‍රියාත්මක වේ.
වෘත්තිය සන්නිවේදකයින් කටයුතු කිරීම.
තාක්ෂණික උපකරණ භාවිතයට ගනී. (ලකුණු 4)